# සමරු කලාපය

2018

# ස්පර්ශනී

## යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා

## සන්නිවේදන හා මහජන සබඳතා උළෙළ

mass.comm

DEPARTMENT OF MASS COMMUNICATION

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# මාධ්‍ය ප්‍රතිපත්ති

සම්මානිත මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ

මාධ්‍ය ප්‍රතිපත්ති වශයෙන් හඳුන්වන්නේ ජනමාධ්‍යවල පැවතිය යුතු පිළිගත් ක්‍රමවේදයන්ට අනුව ආචාර ධර්මානුකූලව මාධ්‍ය ක්‍රියාත්මක වීමයි. අප සමාජය ගොඩ නැගීමට නම් ඕනෑම ක්ෂේත්‍රයක් තුළ අප පිළිගත් ප්‍රතිපත්ති මාලාවක් පැවතිය යුතු ය. ඒ ඒ විෂය ක්ෂේත්‍රවලට අදාළ ව ප්‍රතිපත්ති ඇති අතර ඒවා පවත්වා ගත යුතු ය. නිදසුනක් වශයෙන් සෞඛ්‍ය ප්‍රතිපත්ති, අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති, නෛතික කරුණු සඳහා ප්‍රතිපත්ති ආදී වශයෙන් ඒ ඒ විෂය ක්ෂේත්‍රවල වර්ධනයක් වෙනුවෙන් ප්‍රතිපත්ති පැවතිය යුතු ය. එමෙන් ම ජනමාධ්‍ය සඳහාත් ප්‍රතිපත්ති අවශ්‍ය වේ. මන්ද ජනමාධ්‍ය ආයතනවල ස්වරූපය වන්නේ එම ආයතන හිමිකරුවන් විසින් ගෙන යන පාලනයක් දක්නට ඇත. එය සාමාන්‍ය ස්වරූපයකි. නමුත් අප පිළිගන්නා ආකාරයට ඒවා ක්‍රියාත්මක විය යුතු ය. ජනමාධ්‍ය වශයෙන් විග්‍රහ වන්නේ පොදු ජනතාවට බලපාන විවිධ ආකාරයේ පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් මෙහෙය වන හස්තයකි. මාධ්‍ය ගෙන එන මාධ්‍ය සංදේශ නිවැරදි ආකාරයෙන් විග්‍රහ කර ගැනීම හා සංදේශ විසුරුවා හැරීමට මාධ්‍ය ප්‍රතිපත්ති අවශ්‍ය වේ. ජන මාධ්‍යවල මාධ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ලංකාවේ විවිධ ජනමාධ්‍ය ආයතන හා පුද්ගලයන් විසින් මේ පිළිබඳව සාකච්ඡා කොට ඇත. මාධ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව මූලික කරුණු අධ්‍යයනය කළ හැකි, එක් මූලාශ්‍රයක් සහ ලොව පිළිගත් වාර්තාවක් මැනිං වොයිසස් මැග්බ්‍රයිඩ් වාර්තාවයි. එම වාර්තාවේ සඳහන් වන කරුණු රටවල් වශයෙන් මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අවධානයට ලක් විය යුතු කරුණු දක්වා ඊට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවිධ අණපනත් ආචාර ධර්ම පද්ධති ආදියෙන් මේ පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි ය. මාධ්‍ය ප්‍රතිපත්තියේ රටක යහපත් මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීමට අවශ්‍ය වන බව කරුණු කිහිපයකින් අධ්‍යනය කළ හැකි ය. එනම්, මාධ්‍යවල ඉදිරිපත් කළ යුතු කරුණු විශේෂයෙන් ම අධ්‍යාපනය, වැනි පොදු ජනතාවට ලබා දීම ජනමාධ්‍යයන්හී පොදු ප්‍රතිපත්තියක් ලෙස හඳුනාගත හැකි ය. ඒ තුළින් ජනතාවට ජනමාධ්‍ය තුළින් අධ්‍යාපනයට ලබා දිය හැකි සහයෝගය ඉන් ප්‍රකට වේ. ජනමාධ්‍යයන්හී ප්‍රධාන ප්‍රතිපත්තියක් වශයෙන් "අධ්‍යාපනය" හුවා දක්වන අතර මාධ්‍යයෙන් ඉටු විය යුතු කාර්යයන් වන්නේ ද එය යි. එම නිසා මාධ්‍ය ප්‍රතිපත්ති තුළ ද අධ්‍යාපනයට ප්‍රධාන තැනක් ලබා දිය යුතු ය.

මාධ්‍ය සම්බන්ධයෙන් දෙවන විශේෂ ප්‍රතිපත්තියක් ලෙස දැන්වීම් ආශ්‍රිත ව ගොඩනැගිය යුතු ප්‍රතිපත්ති දැක්විය හැකි ය. දැන්වීම් පිළිබඳ විවිධ ආයතන විවිධ ආකාරයෙන් ප්‍රතිපත්ති ඉදිරිපත් කර ඇත. සමහර අවස්ථාවලදී මෙම ප්‍රතිපත්ති සඳහා ආචාර ධර්ම අනුගමනය කරන්නේ ද නැත. නිදසුනක් වශයෙන් වෙළඳ දැන්වීම් තුළින් ළමයින්ට අහිතකර දැන්වීම් දැක ගත හැකි ය. සෞඛ්‍යට අහිතකර දැන්වීම්, ආයතන ප්‍රචාර පිළිඹිබු කරන දැන්වීම්, භාවාතිශය කරුණු ඉදිරිපත් කරන දැන්වීම්, මිථ්‍යාව පතුරවා හරින දැන්වීම් මේ ආකාරයට විවිධ වූ අදහස් දැන්වීම් තුළින් ඉදිරිපත් කරන ආකාරය නූතන ජනමාධ්‍ය සන්දර්භයේ හඳුනාගත හැකි ය. විවිධ ආකාරයෙන් ජනමාධ්‍ය මඟින් දැන්වීම් ඉදිරිපත් වන විට ඉන් ජනතාවට සිදු කරන බලපෑම අහිතකර විය හැකි ය. මේ සඳහා ජනමාධ්‍යයේදී පොදු ප්‍රතිපත්ති මාලාවක් පැවතිය යුතු ය. වෙළඳ දැන්වීමක ඇති ඒවායේ පැවතිය යුතු අන්තර්ගතයන්, එයින් සිදුකෙරෙන මනෝවිද්‍යාත්මක බලපෑම පිළිබඳ පිළිගත් ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ. රාජ්‍ය මාධ්‍ය හෝ පෞද්ගලික මාධ්‍ය වශයෙන් කිසිඳු බේදීමකින් තොර ව මාධ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුත්තේ ය. විශේෂයෙන් මාධ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මාධ්‍යයට පමණක් සීමා වන බවට අදහසක් පැවතියත් එකී අංශද්වයට ම අදාළ විය යුතු ය. එයට හේතුව වන්නේ ජනමාධ්‍ය භාවිතා කරන ග්‍රාහක කණ්ඩායම පොදු ජනතාවක් වීම යි. භාවිත කරන මාධ්‍ය රාජ්‍ය හෝ පෞද්ගලික වීම ඊට අදාළ නොවේ. ඒ සඳහා ප්‍රතිපත්ති අවශ්‍ය වේ. අද වන විට දැන්වීම් මඟින් වාණිජමය ව්‍යාපාරයක් බවට පත් වී තිබෙන අතර සමාජ හිතකාමීත්වයක් නොපවතියි.

සෑම භාෂාවක්ම ඉගෙනීමට ඇති ඉඩකඩ ජනමාධ්‍ය මඟින් පුළුල් කළ හැකි ය. භාෂාව පිළිබඳ වර්තමානයේ ජනමාධ්‍යයන් තුළ බොහෝ අර්බුදකාරී තත්ත්වයන් ගොඩනඟා ඇත. භාෂාවන් පිළිබඳ ඉගෙනීමට ඉඩකඩ සැලසීම ජනමාධ්‍යයන්ගේ වගකීම වන්නේ ය. දියුණු රටවල එක් පුද්ගලයකුට භාෂා කිහිපයක් ඉගෙන ගැනීමට ඇති ඉඩකඩ තිබීම තුළින් රටක් තුළ සංහිඳියාවක් ඇති වීම ස්වභාවික ය. එකිනෙකාගේ භාෂාවන්ට ගරු කිරීම යහපත් මාධ්‍ය සංස්කෘතියක් තුළ දැක ගත හැකි ලක්ෂණයකි. භාෂාව ඉගෙනීම තුළින් ජනතාවට සංස්කෘතික වශයෙන් සංහිඳියාවක් ඇති වේ.

තවත් ප්‍රතිපත්තියක් වශයෙන් මාධ්‍යවේදීන්ට අධ්‍යාපනය ලෙස කාලීන මාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාව කේන්ද්‍ර කිරීම මාධ්‍යකරුවන්ට අධ්‍යාපනය ලබාදීම තුළින් අදහස් කරන්නේ ජනතාවට බලපාන ජනමාධ්‍ය තුළින් මාධ්‍යකරුවා සිය මාධ්‍ය උපයෝගී කරගෙන නිසි පරිදි මාධ්‍ය හැසිරවීම පිළිබඳ මාධ්‍යකරුවාට වන අවබෝධයයි. ලංකාව තුළදී ද පසුගිය සමයේ ජනමාධ්‍යවේදීන්ට අධ්‍යාපනයක් ලබා දීම පිළිබඳ ව සාකච්ඡාවට භාජනය වූ කරුණක් වුව ද මේ වන තෙක් එය ක්‍රියාත්මක නොවීම ම ගැටලුවක් වී පවතී. මාධ්‍යකරුවන් සඳහා තොරතුරු වාර්තාකරණයේ දී වාර්තා කළ යුතු තොරතුරුවල ආචාරධර්මීය පදනම පිළිබඳ අවබෝධයක් මාධ්‍යවේදියාට තිබිය යුතු ය. තමන් ඉදිරිපත් කරන මාධ්‍ය සංදේශයක් තුළින් සමාජයට කොතරම් බලපෑම් කරනවා ද යන්න ජනමාධ්‍යකරුවා ලැබිය යුතු එක් කොටසකි. තමන් ඉදිරිපත් කරන සංදේශය තුළින් මිනිසුන් අතර අරගලයක් ඇති නොවන ආකාරයෙන් ඒ ඒ මාධ්‍ය අනුව සංදේශය සැකසීමට මාධ්‍යවේදියාට දැනුමක් තිබිය යුතු ය.

මැග්බ්‍රයිට් වාර්තාවේ දක්වන තවත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් වන්නේ ප්‍රාදේශීය සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවාලීම හා ඒවා තුළින් කිසියම් බලපෑමක් හා ජනතාවට සන්නිවේදනය කිරීමට අවස්ථාවක් සලසාලීමයි. රටක ප්‍රාදේශීය ගුවන්විදුලි හා ප්‍රාදේශීය පුවත්පත් ආයතන බහුමාධ්‍යකරණයට, මාධ්‍ය ගොදුරු යුතු බව දක්වයි .වර්තමානයේ දී සමාජ මාධ්‍යයන් තුළ එවැනි

ප්‍රාදේශීය මට්ටමේ වර්ධනයක් සිදු වූ ආකාරය දැකිය නොහැකි ය. අද වන විට ප්‍රාදේශීය සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත. ඒ තුළින් කිසියම් ආකාරයක බලපෑමක් ග්‍රාහකයන් වෙත සිදු කළ හැකි ය.

මීළඟට මැක්බ්‍රයිඩ් වාර්තාව දක්වන ප්‍රතිපත්තිය වන්නේ රටක ජාතික සංවර්ධනයට මාධ්‍ය අවධානය යොමු කළ යුතු බව යි. ජාතික සංවර්ධනය සඳහා ජනමාධ්‍ය කිනම් රජයක් බලයේ පැවතියත් මාධ්‍ය ප්‍රතිපත්තිය පොදු ජනතාව වෙනුවෙන් අඛණ්ඩ ව ක්‍රියාත්මක විය යුතු බවයි. මාධ්‍ය තුළින් කිසියම් ආකාරයකට රටේ ජාතික සංවර්ධනයට අවධානයක් යොමු කරමින් ඒ සඳහා ක්‍රියාත්මක විය යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය.

ළමයින් සඳහා මාධ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය වීම මාධ්‍ය ප්‍රතිපත්තින්හි වැදගත් කරුණක් වී ඇත. ළමයින් උදෙසා ජනමාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු ය. අද වන විට විවිධ රටවල්වල මේ සඳහා විවිධ ක්‍රම අනුගමනය කරමින් සිටී. නිදසුනක් වශයෙන් ඇමරිකාවේ විවිධ මාධ්‍ය ආයතන යටත් පිරිසෙන් සෑම මාධ්‍ය ආයතනයක් ම පැය 6ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ යුතු බව ධවල මන්දිරයේ තීරණයක් විය. මාධ්‍ය කුමන වර්ගයකට අයත් වුවත් එකී මාධ්‍යයන්ගෙන් අධ්‍යාපනය ලබා දිය යුතු ය. මැග්බ්‍රයිඩ් වාර්තාව ප්‍රතිපත්තියක් වශයෙන් අධ්‍යාපනය මාධ්‍ය ප්‍රතිපත්ති තුළ අන්තර්ගත විය යුතු බව දක්වයි.

පොත්පත්, පුවත්පත්, පුස්තකාල අවධානය යොමු කළ යුතු බව මැග්බ්‍රයිඩ් වාර්තාව දක්වයි. රටක මාධ්‍ය පරිහරණය උදෙසා රාජ්‍යයන් විසින් විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන අතර ප්‍රාදේශීය පුස්තකාල ඇති කිරීම දැකිය හැකි ය. ඒ තුළින් ඔවුහු ළමා ප්‍රජාව අතර සාක්ෂරතාව වර්ධනය කරති. සංවර්ධනය, අධ්‍යාපනය, දැන්වීම් සහ ළමයින් ඉලක්ක කොට මාධ්‍යකරුවන්ට පුහුණුවක් ලබා දීම සඳහා පුස්තකාල පහසුකම් ඇති කිරීමටත්, ළමා වැඩසටහන් ඇති කිරීමටත් මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අවධානයට ලක් කළ යුතු බව දක්වයි.